# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2016/6 - 2017 අප්‍රේල් මස 24 වැනි සඳුදා - 2017.04.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ වැනි ව්‍යවස්ථාව පරිදි ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ වැනි ව්‍යවස්ථාව පරිදි ජාතික පොලිස් කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී බලතල වලින් ඇතැම් බලතල 2016 මැයි මස 06 වැනි දින අංක 1965/37 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ උපලේඛනයේ නියම කර ඇති පරිදි පොලිස්පතිවරයා වෙත සහ පොලිස් නිලධාරීන් වෙත පවරා ඇත.

2017 ජනවාරි 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, එම *ගැසට් පත්‍රයේ උපලේඛනය* වෙනුවට පහත සඳහන් උපලේඛනය ආදේශ කරනු ලැබේ

ජාතික පොලිස් කොමිෂන් සභාවේ නියමය පරිදි

පී. එච්. මනතුංග,
සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

2017 ජනවාරි මස 26 වැනි දින,
කොළඹ 07,
9 වන ගොඩනැගිල්ල,
බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,
ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලයේ දී ය.


1A - PG 3801 — 107 (2017/12)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| අංකය | *I තීරුව*<br>*නිලධාරී වර්ගීකරණයන්* | *II තීරුව*<br>*පවරනු ලබන බලතල* | *III තීරුව*<br>*බලතල පවරන ලද නිලධරයන්* |
|---|---|---|---|
| 01 | ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථානයන්හි ස්ථානාධිපතිවරුන් හැර) | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටිය/සේවා ව්‍යවස්ථාවන්ට අනුකූලව තනතුරුවලට පත්කිරීම සහ උසස් කිරීම.<br>ii. පරිවාස කාලය තුළදී පත්වීම අවලංගු කිරීම හෝ සේවය නතර කිරීම.<br>iii. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ස්ථාන මාරු කිරීමේ පටිපාටියට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>iv. විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම.<br>v. වැඩ තහනම් කිරීම.<br>vi. තනතුර අතහැර යාම සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සළකා බැලීම. | පොලිස්පතිවරයා |
| 02 | ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථාන භාර නිලධරයන් සහ ක්‍රියාකාරී කොට්ඨාශ වල ස්ථානාධිපතිවරුන් හැර) | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පටිපාටියට අනුව ස්ථාන මාරු කිරීම.<br>ii. විනය පාලනය.<br>iii. වැඩ තහනම් කිරීම.<br>iv. සේවය අතහැරයාම සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සළකා බැලීම. | පොලිස්පතිවරයා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් |
| 03 | ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් | i. පරිවාස හෝ වැඩ බැලීමේ කාලසීමාවට පසු පත්වීම ස්ථිර කිරීම.<br>ii. සේවයෙන් ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ලැබෙන ලිපි භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම. | පොලිස්පතිවරයා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා (පරිපාලන) |
| 04 | ප්‍රධාන පොලිස් පරීක්ෂක හා ඊට පහළ නිලයන් | i. යම් නිලධාරියකුගේ ඊළඟ නිලයට, ශ්‍රේණියට හෝ තනතුරට උසස් කිරීමෙන් පසු, එක්වරකට වර්ෂය බැගින් උපරිම වශයෙන් වසර 03 ක අනිවාර්ය වැඩ බැලීමේ සේවා කාලය දීර්ඝ කිරීම.<br>ii. කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණකර ගැනීම සඳහා වරකට වර්ෂය බැගින් උපරිම වශයෙන් වසර 03 ක් පරිවාස කාලසීමාව දීර්ඝ කිරීම. | පොලිස්පතිවරයා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් |

උපලේඛනය (සම්බන්ධිතයි)

| අංකය | *I තීරුව*<br>*නිලධාරි වර්ගීකරණයන්* | *II තීරුව*<br>*පවරනු ලබන බලතල* | *III තීරුව*<br>*බලතල පවරන ලද නිලධරයන්* |
|---|---|---|---|
| 05 | පොලිස් පරීක්ෂක හා ඊට පහළ නිලයන් | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමතකර ඇති පටිපාටීන්ට අනුකූලව ඒ ඒ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පරිපාලන බල ප්‍රදේශය තුළ ස්ථාන මාරුකිරීම්. (පොලිස් ස්ථාන භාර නිලධාරීන් සහ ක්‍රියාකාරී කොට්ඨාශ වල ස්ථානාධිපතිවරුන් හැර)<br>ii. සේවයෙන් පහකිරීම් හැර ඔවුන්ගේ පරිපාලන බල ප්‍රදේශය තුළ විනය පාලන කටයුතු.<br>iii. සේවය අතහැරයාම සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සලකා බැලීම (පොලිස් ස්ථාන භාර නිලධාරීන් සහ ක්‍රියාකාරී කොට්ඨාශවල ස්ථානාධිපති වරුන් හැර) | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා |
| 06 | පොලිස් පරීක්ෂක හා ඊට පහළ නිලයන් | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමතකර ඇති ක්‍රමවේදයන්ට අනුකූලව නියෝජ්‍ය පොලිස්පති වරයාගේ පරිපාලන බලප්‍රදේශය යටතට ගැනෙන ස්ථාන මාරුකිරීම් (පොලිස් ස්ථාන භාර නිලධාරීන් සහ ක්‍රියාකාරී කොට්ඨාශ වල ස්ථානාධිපතිවරුන් හැර) | නියෝජ්‍ය පොලිස්පතිවරයා |
| 07 | පොලිස් පරීක්ෂක හා ඊට පහළ නිලයන් | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමතකර ඇති ක්‍රමවේදයන්ට අනුකූලව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි (පොලිස් අධිකාරි I ශ්‍රේණිය) ; පොලිස් අධිකාරි (පොලිස් අධිකාරි II වන ශ්‍රේණිය) වරුන්ගේ ඒ ඒ පරිපාලන බලප්‍රදේශය යටතට ඇතුළත් ස්ථාන මාරුකිරීම්<br>(පොලිස් ස්ථාන භාර සහ ක්‍රියාකාරී කොට්ඨාශ වල ස්ථානාධිපතිවරුන් හැර) | නියෝජ්‍ය පොලිස්පතිවරුන් සහ කොට්ඨාශ භාර නිලධාරීන් |
| 08 | පොලිස් පරීක්ෂක හා ඊට පහළ නිලයන් | i. ඒ ඒ පරිපාලන බලප්‍රදේශයන් තුළ වැඩ තහනම් කිරීම<br>ii. අදාළ පරිපාලන බලප්‍රදේශය තුළ විනයශාලා දඬුවම් නියම කිරීම (පොලිස් ස්ථාන භාර නිලධාරීන් සහ ක්‍රියාකාරී කොට්ඨාශ වල ස්ථානාධිපතිවරුන් හැර) | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති<br>නියෝජ්‍ය පොලිස්පති<br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී<br>(පොලිස් අධිකාරී I ශ්‍රේණිය)<br>පොලිස් අධිකාරී<br>(පොලිස් අධිකාරී II ශ්‍රේණිය)<br>සහකාර පොලිස් අධිකාරී |

උපලේඛනය (සම්බන්ධිතයි)

| *අංකය* | *I තීරුව*<br>*නිලධාරි වර්ගීකරණයන්* | *II තීරුව*<br>*පවරනු ලබන බලතල* | *III තීරුව*<br>*බලතල පවරන ලද නිලධරයන්* |
|---|---|---|---|
| 09 | පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් | i. ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ වැරදි පිළිබඳ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි පිළිබඳ විනය පාලනය<br>ii. සේවය අතහැර යාමේ නිවේදනයට අදාල අභියාචනා සලකා බැලීම | නියෝජ්‍ය පොලිස්පතිවරුන් |

05-220

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.